# 1818 සිංහල විමුක්ති සටනේ දී බෞද්ධ භික්ෂුවගේ භූමිකාව පිළිබඳව ඓතිහාසික විමර්ශනයක්

කසුන් සාරංග කොඩිකාර[1]

බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව 1817-1818 දී ආයුධ සන්නද්ධ සටනක් ඌව වෙල්ලස්ස මූලික කරගෙන සිදුවිය. මෙම සටන් ව්‍යාපාරයේ එක ම අරමුණ වූයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනයෙන් නිදහස්වීම යි. 1815 උඩරට රදළ ප්‍රධානීන් හා බ්‍රිතාන්‍ය රජය සමඟ ඇතිකරගත් සම්මුතියෙහි ඇතිකරගත් වගන්තිය බ්‍රිතාන්‍ය පාර්ශවයෙන් උල්ලංඝනය කිරීම හේතුවෙන් භික්ෂූන් වහන්සේලා රදළ ප්‍රධානීන් සහ සාමාන්‍ය ජනතාව යන සියලු ජන කොටස්වලට හැඟෙන්නට වූයෙන් ඔවුන් තුළ ඉංග්‍රීසීන් කෙරෙහි අප්‍රසාදයක් ගොඩනැගෙන්නට විය.

ඉංග්‍රීසි ආණ්ඩුව ක්‍රිස්තු ධර්මානුකූලව හැඩගැසුණු පාලකයන්ගේ ආණ්ඩුවක්වූ බැවින් නව ආණ්ඩුව යටතේ මුලින් ම පස්වන වගන්තියේ කඩකිරීම ඇරඹුණබව ද ඒ මගින් භික්ෂූන් වහන්සේලා අසතුටට පත්වූ බව දැකිය හැකිවිය. බෞද්ධ නොවූ පාලකයන්ට සම්මුතියෙන් පොරොන්දුවූ ප්‍රකාර බෞද්ධ සිද්ධස්ථානවලට නියමිත වත්පිළිවෙත් කිරීම සහ භික්ෂූන් වහන්සේලාට වැඳුම් පිදුම් කොට ගරු බුහුමන් දැක්වීම කළ නොහැකි විය. සම්මුතිය ප්‍රකාර භික්ෂූන් වහන්සේලාගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද ආරක්ෂා කෙරෙනු වෙනුවට භික්ෂූන් වහන්සේලා විසින් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාට ගරු බුහුමන් දැක්වියයුතු විය. මෙසේ ඉංග්‍රීසීන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් ඊට එරෙහිව බෞද්ධ භික්ෂූන් මූලිකත්වය ගනිමින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ග්‍රහණයෙන් ලාංකික වැසියන් අත්මිදීමේ අවශ්‍යතාවය තදින් දැනෙන්නට විය. එහි දී ඌව වෙල්ලස්ස ප්‍රදේශ දොරේ සාමි නැමැති පුද්ගලයා සිංහලේ රජු බවට ප්‍රකාශයට ප්‍රකාශ කරන ලදී.

එහි දී බ්‍රිතාන්‍ය පාලනය කෙරෙහි අප්‍රසාදිත ජනතාව ඒකරාශී කිරීමට භික්ෂූන් වහන්සේලා අට නමක් සහ වැද්දන් 200ක් සමඟ සිටි බව කියැවේ. එහි දී භික්ෂූන් වහන්සේලාගේ මූලික භූමිකාව 1818 දී කැරැල්ලේ දී හඳුනාගත හැකිය. එමෙන්ම ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ බ්‍රිතාන්‍යයන්ට එරෙහිව ස්වදේශිකයන්ගේ ප්‍රතික්‍රියා ඇතිවන්නට විය. එහි දී දළදාව බ්‍රිතාන්‍යයන් සතුවීම වැළැක්වීමට වාරියපොළ සුමංගල හිමියන් දන්ත ධාතුව රැගෙන පලාගිය නමුත් 1818 නොවැම්බර් මාසයේ දී ස්වදේශිකයන්ට දඬුවම් හිමි විය. එහි දී කැප්පෙටිපොළ, මඩුගල්ල, පිළිමතලාව සහ ඉහළගම යන අය පිළිබඳ නඩු විසඳා ඔවුන්ගේ හිස් ගසා දැමීමට නියම විය. මිනිසුන් 47 මරණයට පත්කොට 6 දෙනෙකු පිටුවහල්කොට 8 දෙනෙකුට සුළු දඬුවම් පමුණුවා තිබිණි. දළදා මාළිගාවෙන් දන්ත ධාතූන් වහන්සේ පැහැරගත් වාරියපොළ සුමංගල හිමි ඇතුළු සටනේ නායකත්වය දැරූ භික්ෂූන් වහන්සේලා වන නාපේ තෙරුන්නාසේ, පල්ලේගම තෙරුන්නාසේ, මැදගම තෙරුන්නාසේ, බදුලුවෙලේ තෙරුන්නාසේ, කළුවරගස්වැවේ මහතෙරුන්නාසේ හා අන්දරවැවේ තෙරුන්නාසේ යනාදි භික්ෂූන් වහන්සේලා යාපනයේ සිරමැදුරක රඳවා තැබිය යුතු බවට සර් එඩ්වන්ස් බාන්ස් ආණ්ඩුකාරයා 1820 පෙබරවාරි 25 වැනි දින බ්‍රිතාන්‍යයට යැවූ අංක 05 දරන සංදේශයේ අඩංගු වේ.

එමෙන් ම සත්කෝරලේ වැඩබලන ඩබ්ලිව් මර්පෙි ඒජන්තවරයාට එහි පිටපතක් ද යවා ඇත. මෙම තොරතුරු ඉදිරිපත් කිරීමේ දී ප්‍රධාන වශයෙන් 1818 සිංහල විමුක්ති සටනේ

---

1 සහාය කථිකාචාර්ය, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
Email: kodikasun99@gmail.com

දී භික්ෂුවගේ භූමිකාව පිළිබඳව මෙම අධ්‍යයනය මගින් තොරතුරු රැසක් මෙමගින් හෙළිදරව් කරගත හැකි ය. මෙහි දී මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය වූයේ පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය යි. 1818 විමුක්ති සටනේ දී වඩාත් ප්‍රචලිත ව ඇත්තේ රදළ ප්‍රධානීන් පිළිබඳව ය. එහෙත් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ දායකත්වය හා ක්‍රියාකාරීත්වය හා එහි ප්‍රමාණිකත්වය පිළිබඳ විමර්ශනය කිරීමෙන් ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගයේ මුල්අවධියේ ලාංකික බෞද්ධ භික්ෂුවගේ භූමිකාව නිවැරදිව තේරුම් ගැනීම මෙහි අපේක්ෂාව යි.

**ප්‍රමුඛ පද:** බ්‍රිතාන්‍ය ආධිපත්‍යය, භික්ෂූන් වහන්සේලා, ඌව වෙල්ලස්ස, රදළ ප්‍රධානීන්, දළදා වහන්සේ